# කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී විශේෂ උපාධි හතරවන වසර (මාර්ගගත) පරීක්ෂණය

## දෙවන සෙමෙස්තරය - 2019/2020

## BST 4285 – ලෝක ආගම් පිළිබඳ අධ්‍යයනය

### විවෘත ග්‍රන්ථ ලිඛිත පරීක්ෂණය

- කාලයඃ <u>පැය 24</u> ක් තුළ පිළිතුරු සම්පූර්ණ කොට පිළිතුරු පත්‍රය LMS වෙත උඩුගත කළ යුතුය.
- ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු (ලකුණු 20 බැගින්) හිමිවේ.
- එක් ප්‍රශ්නයකට ඔබගේ පිළිතුරු <u>**වචන 1000කට**</u> නොවැඩි විය යුතුය.

---

1. ආගමික අන්තවාදවලට නොවැටීම පිණිස ආගම යනු කුමක්දැයි හඳුනා ගැනීම මගපාදන ආකාරය ආගම පිළිබඳ විවිධ නිර්වචන ඇසුරෙන් පැහැදිලි කරන්න.

2. හින්දු ආගම පිළිබඳ හැඳින්වීමක් කරමින් එහි හස්තසාර ග්‍රන්ථය සේ සැලකෙන භගවද්හීතාව පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

3. අල්කුර්ආනය සහ නබිතුමාගේ මග පෙන්වීම් (සුන්නාව) අනුව ජීවත්වීම පිළිබඳ ඉස්ලාම් ආගමෙහි දැක්ම විස්තර කරන්න.

4. ආගමික නිදහස යනු කුමක්දැයි ඉස්ලාම් ආගමික ඉගැන්වීම් ඇසුරෙන් පැහැදිලි කරන්න.

5. "නාසරෙත්හි ජේසුන්ගේ ඓතිහාසික, විචිත්‍ර හා ආන්දෝලනාත්මක දිවිය, ප්‍රතිපදාව, දේශනා අන්තර්ගතය හා අවසානයෙහි සිදුවූ කුරිරු කුරුසගත කිරීමට ප්‍රබල හේතුව උන්වහන්සේගේ ප්‍රතිසංස්කෘතික හා විකල්පීය ආගමික දැක්ම බව නව ගිවිසුමේ සුවිශේෂ ග්‍රන්ථ සාක්ෂි දරයි" ඉහත සඳහන් කිතුනු ආගමික - සමාජ කියවීම ඔබ අධ්‍යයනය කළ කරුණු ඔස්සේ සැකවින් සාකච්ඡා කරන්න.

****************************